# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2018 අංක 13 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2018 ජුනි මස 05 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2018 ජුනි මස 08 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිල : රු. 8.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 2018 අංක 13 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2018 ජූනි මස 05 වන දින]

එල්. ඩී.— ඕ. 27/2017

**ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2018 අංක 13 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 6 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය, එම ප්‍රඥප්තියේ 6අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:– — ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන පනතෙහි 6අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"මණ්ඩලයේ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා.

6අ. (1) තේ කර්මාන්ත ක්ෂේත්‍රයේ පුළුල් අත්දැකීම් ඇති තැනැත්තන් අතරින් 6 වන වගන්තියේ දක්වා ඇති සාමාජිකයකු නොවන ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයකු අමාත්‍යවරයා විසින් මණ්ඩලයට පත් කරනු ලැබිය හැකි ය.

(2) ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා-

(අ) පූර්ණකාලීන නිලධරයකු විය යුතු ය;

(ආ) ශ්‍රී ලංකාව තුළ සහ ඉන් පිටත තේ කර්මාන්තයේ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමේ දී සභාපතිවරයාට සහාය දිය යුතු ය; සහ

(ඇ) මණ්ඩලයේ කටයුතු සම්බන්ධීකරණය කිරීම ඇතුළු මණ්ඩලයේ කටයුතු පරිපාලනයේ දී, කළමනාකරණයේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී සභාපතිවරයාට සහාය දිය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් ඒ සඳහා හේතු දැක්වීමෙන් පසු ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයාගේ ධුර කාලය පත් කරනු ලබන දින සිට වසර තුනක කාලසීමාවක් සඳහා විය යුතු අතර, (3) වන උපවගන්තියේ දක්වා ඇති පරිදි ධුරයෙන් ඉවත් කරනු ලැබ ඇත්නම් මිස, නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය. එලෙස නැවත පත් කරනු ලැබීම අනුගාමී හෝ එසේ නොවුන ද වැඩිදුරටත් වූ එක් වාරයකට වඩා නොවැඩි විය යුතු ය.

(5) ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයාගේ ධුරය, මිය යාමෙන්, (3) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් හෝ තත්කාර්යය සඳහා අමාත්‍යවරයා අමතනු ලැබූ ලිපියක් මගින් ධුරයෙන් ඉල්ලා අස්වීමෙන් පුරප්පාඩු වන්නේ ය.

(6) රෝගාතුරවීම, දුබලතාවය හෝ තාවකාලිකව ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුවෙන් ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයාට සිය ධුරයේ කටයුතු ඉටුකිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක දී අමාත්‍යවරයා විසින් ඔහු වෙනුවෙන් කටයුතු කිරීම සඳහා මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු පත් කළ යුතු ය.

(7) මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අදාළ රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පරිදි වූ යම් පාරිශ්‍රමිකයක් ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයාට ගෙවනු ලැබිය යුතු ය.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.